අද
city edition
2023-12-08
සිකුරාදා
012 / 242
RS.40/=

# වැස්ස නිසා වගාවලින් 40%ක් විනාශයි

- ගස්ලබු, කෙසෙල්, කොමඩු සහ අමු මිරිස් මිල ඉහළට

>>P2

# නිවුන් දරුවන් විකුණූ මව රිමාන්ඩ්

- දරුවන්ව මිලදී ගත් කාන්තාවන් දෙදෙනාත් රිමාන්ඩ්

>>P3

# යළිත් දේශීය බිත්තර හිඟයක්

ඇතැම් ප්‍රදේශවල බිත්තරයක මිල රු.55 දක්වා ඉහළට

>>P2

# පාස්කු ප්‍රහාරයට පෙර බුද්ධි තොරතුරු 7ක් දීලා

## ත්‍රස්ත ප්‍රහාරයක් එල්ල විය හැකි බව පාස්කු ප්‍රහාරයට පෙර අප්‍රේල් මාසයේදී දින 4ක දී තොරතුරු ලැබිලා

රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂ නිලන්ත ජයවර්ධන විසින් එවකට ජාතික බුද්ධි ප්‍රධානියාට, පොලිස්පතිට, CIDය භාර නි.පොලිස්පතිට,ආරක්ෂක ලේකම්ට ලිඛිතව දැනුම්දීලා

- සභානායක අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත් පාර්ලිමේන්තුවේදී හෙළිකරයි

# පිළිකා රෝගීන්ගේ ගිණුම්වලින් ලක්ෂ 250ක් වංචා කළ 3ක් රිමාන්ඩ්

>>P7

# IMF දෙවැනි වාරිකය 12දා වනවිට ලැබේවි

- විදේශ කටයුතු අමාත්‍ය අලි සබ්රි මහතා

>>P2

# කෙසෙල් පට්ටා නූල් නිෂ්පාදනය වසර 04ක සිට ඇනහිටලා

ලක්ෂ 119කට ගෙනා යන්ත්‍රය පැත්තකට දමලා



● චන්දන සමරවික්‍රම

කෙසෙල් පට්ටා භාවිත කරමින් නූල් නිෂ්පාදනය කිරීමේ අරමුණ ඇතිව රුපියල් එක්කෝටි දහනව ලක්ෂ තුන්සිය තිස්පහක වියදමක් දරා 2020 වර්ෂයේ ඉන්දියානු රජයෙන් ගෙන්වනු ලැබූ එම යන්ත්‍රය දැනට වර්ෂ 04ක පමණ කාලයක සිට භාවිතයට නොගෙන පවතින බව ජාතික විගණන කාර්යාලය මගින් නිකුත් කරන ලද වාර්තාවක සඳහන් වේ.

ශ්‍රී ලංකා පේෂ කර්ම හා ඇඟලුම් ආයතනය විසින් 'Banana Yarn' ව්‍යාපෘතිය යටතේ 2019 වර්ෂයේදී කෙසෙල් පට්ටා භාවිත කර නූල් නිෂ්පාදනය කිරීමේ අරමුණින් මෙම යන්ත්‍රය ඉන්දියාවෙන් මිලට ගෙන තිබිණි.

අපේක්ෂිත පරිදි මෙම කටයුතු සාර්ථක නොවීම නිසා මෙම යන්ත්‍රය භාවිතයට නොගෙන පවතින අතර, මෙය ක්‍රියාත්මක කිරීමට පුහුණුව ලත් යන්ත්‍ර ක්‍රියාකරුවෙකු නොවන බව එම විගණන වාර්තාවක සඳහන්ව ඇත.

වත්කම් ඵලදායී ලෙස භාවිත කළ යුතු බවද එම විගණන වාර්තාවේ සඳහන්ව ඇත.

# 'ලෝක සාමය' වෙනුවෙන් විපක්ෂනායක සාටකයක් පළඳියි



>>P2

# පොහොට්ටුවේ ජනපති අපේක්ෂක ලැයිස්තුවට නම් 4ක්

## ජනපති රනිලුත් ඒ අතර, අවසන් තීරණය බැසිල් අත ?

>>P2



# උතුරු පොල් ත්‍රිකෝණයේ පැළ සිටුවීමේ හමුදා ක්‍රියාන්විතය ඇරඹෙයි

වන්නි බලප්‍රදේශය තුළ පොල් පැළ ලක්ෂයක් රෝපණය කිරීම අරමුණයි

>>P2

# අධිවේගී මාර්ගවලින් STF ඉවතට?



>>P2

# "කිඹුලාවල 'ස්ට්‍රීට් ෆුඩ්' අද විතරයි ඉවත්කර නොගන්නේ නම් නීතිමය පියවර"

- මාර්ග සංවර්ධන අධිකාරිය



>>P3

# ඉදිරි වසර 3 සඳහා 36%ක වැටුප් වැඩි වීමක් ඉල්ලා වරාය සේවකයෝ විරෝධතාවේ



● ඉන්දික සේවාවිතාරණ

වරාය සේවකයන්ට ඉදිරි වසර තුනක කාලයක් සඳහා සියයට තිස්හයක වැටුප් වැඩි වීමක් ලබාදෙන ලෙස ඉල්ලා හා තවත් ගැටලු කිහිපයක් මුල්කර ගනිමින් ඊයේ (07දා) වරාය සේවකයන් විරෝධතා ව්‍යාපාරයක නිරත විය.

වරාය ඉදිරිපිට බාන් ඔරලෝසු කණුව අසලදී මෙම විරෝධතා ව්‍යාපාරය පැවැත් වූ අතර මෙම විරෝධතා ව්‍යාපාරය වරාය වෘත්තීය සමිති එකමුතුව විසින් සංවිධානය කර තිබුණි.

වරාය සේවකයන්ට වැටුප් වැඩි වන්නේ වසර තුනකට වරක් බවත් අදාළ වැඩි වීම වැටුප් ගිවිසුමක් හරහා සිදුවන බවද සමස්ත ලංකා වරාය පොදු සේවක සමිතියේ ලේකම් නිරෝෂන් ගොරකාන මහතා සඳහන් කළේය.

මේ අනුව 2024 සිට 2026 දක්වා කාලයට වැටුප් වැඩි කිරීමට අදාළව වැටුප් ගිවිසුම් අත්සන් කිරීමට සියලුම කටයුතු සූදානම් කර තිබියදී ආණ්ඩුව විසින් වැටුප් ගිවිසුම් අහෝසි කර දැමූ බවද පවසා සිටියේය.

වැටුප් ගිවිසුම් අහෝසි කිරීම නිසා වරාය සේවකයන් 8,000කට ඉදිරියේදී වැටුප් වැඩි වීම සම්බන්ධයෙන් විශාල ගැටලුවක් නිර්මාණය වී තිබෙන බවද පවසා සිටියේය.

මේ නිසා කඩිනමින් වැටුප් ගිවිසුම් අත්සන් කර සේවක වැටුප් ඉහළ දැමිය යුතු බවත් මීට අමතරව වරායේ දේපළ විකුණා දැමීමට සිදුකරන සැලසුම් අහෝසි කළ යුතු බවත් පවතින උසස් වීම් ගැටලුවට විසඳුම් ලබා දිය යුතු බවද සඳහන් කළේය.

මෙම ගැටලු මුල්කර ගනිමින් පළමු ක්‍රියාමාර්ගය ලෙස මෙම විරෝධතා ව්‍යාපාරය පැවැත්වීමට කටයුතු කළ බවත් ඉදිරියේදී වෘත්තීය ක්‍රියාමාර්ග දැඩි කිරීමට කටයුතු කරන බවද පවසා සිටියේය.

2021 වසරේදී අත්සන් කළ වැටුප් ගිවිසුමේ කාලය මේ මස 31 දා අවසන් වන බවත්, වැටුප් වැඩි කිරීමක් සිදුනොකළහොත් ලබන වසර තුළදී පවා වරාය සේවකයන්ට හිමිවන්නේ දැනට ලබා දෙන වැටුප බවත් හෙතෙම පැවසීය.



## කාලගුණය

උපරිම උෂ්ණත්වය

33°C පොතුවිල්

අවම උෂ්ණත්වය

13°C නුවරඑළිය

වැසි තත්ත්වය

දිවයිනේ බොහෝ පළාත්වල ප.ව. 1.00 න් පමණ පසු තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ. සබරගමුව, මධ්‍යම සහ ඌව පළාත්වල උදෑසන කාලයේදී මීදුම සහිත තත්ත්වයක් පැවතිය හැකියි.

සුළං තත්ත්වය

දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල සුළං නිරිත සිට ගිනිකොන දක්වා දිශාවලින් හමා එන අතර සුළං වේගය පැ.කි.මී.(20-30) පමණ වේ.

මුහුදේ තත්ත්වය

දිවයින වටා වන මුහුදු ප්‍රදේශ සාමාන්‍ය ස්වභාවයේ පවතී.

අද

කර්තෘ මණ්ඩලය

ලිපිනය:
අංක 08, හුණුපිටිය හරස් පාර, කොළඹ 02.

දුරකථන:
2479670, 2479671

ෆැක්ස්:
2479668

විද්‍යුත් තැපැල:
ada@wijeya.lk / adanewspaper@gmail.com

වෙළෙඳ දැන්වීම් අංශය:
011 2479 830

බෙදාහැරීමේ අංශය:
011 2479 625

දායකත්ව අංශය:
011-2479 626

අද

පාඨක අයිතීන් සුරැකීම

අද පුවත්පත ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම වෙත සහයෝගය දක්වයි.

මේ පුවත්පතෙහි සේවා කරන කර්තෘ ඇතුළු පත්‍රකලාවේදීන් සියලු දෙනම 'පාඨක අයිතීන් සුරැකීම' සහ පුවත්පත් පැමිණිලි කොමිසම මඟින් ක්‍රියාවට නංවන 'කර්තෘ සංසදයට' අදාල ආචාර ධර්ම සුරැකීමට නිබඳව බැඳී සිටිති. පුවත්පතේ පළකෙරෙන ප්‍රවෘත්තියක් නිසා ඔබට සිදුවන යම් අපහසුතාවක් පිළිබඳ අප පුවත්පත දැනුම්වත් කිරීමට අවස්ථාව ඇත.

ඒ පිළිබඳ ඔබ සෑහීමකට පත් නොවන්නේ නම්, 'ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම' වෙතද ඔබේ පැමිණිල්ල ඉදිරිපත් කළ හැකිය.

ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම
Press Complaints of Sri Lanka

96, කිරුළ පාර, කොළඹ 05.

| | |
|---|---|
| දුරකතනය | 5 353 635 |
| ෆැක්ස් | 5 335 500 |
| ඉමේල් | pccsl@pccsl.lk |
| වෙබ් | www.pccsl.lk |

# IMF දෙවැනි වාරිකය 12දා වනවිට ලැබේවි

## – විදේශ කටයුතු අමාත්‍ය අලි සබ්රි මහතා


දිනේෂ් සමරකෝන්

එළඹෙන 12වැනිදා වනවිට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ දෙවැනි වාරිකය ලැබීමේ විශාල සම්භාවිතාවක් තිබෙන බවත්, එය රට බංකොලොත්භාවයෙන් මුදාගැනීමේ පළමු අඩිතාලම බවත් විදේශ කටයුතු අමාත්‍ය අලි සබ්රි මහතා පැවසීය.

පාර්ලිමේන්තුවේ ඊයේ (07දා) පැවති අයවැය කාරක සභා අවස්ථා විවාදයේදී අදහස් පළ කරමින් හෙතෙම මේ බව සඳහන් කළේය.

එහිදී වැඩිදුරටත් අමාත්‍ය අලි සබ්රි මහතා මෙලෙස අදහස් දක්වා සිටියේය.

"ණය ප්‍රතිව්‍යුහගත කිරීමේදී එකිනෙකට වෙනස් රටවල් සියල්ල කොහොමද ඉක්මනට කැමති කරවා ගන්නේ? ඒක ඉතාමත්ම බරපතළ දෙයක්. ජනාධිපතිවරයාගේ නායකත්වය යටතේ මුදල් ඇමතිවරයා ලෙස අපට මේ රටවල් සියල්ල කළමනාකරණය කර ගැනීම සඳහා විශාල වගකීමක් පැවරිලා තියෙනවා. ගොඩක් දෙනෙක් කිව්වේ මේක කරන්න බැරි වෙයි කියලා. ඒ අනුව අපට පුළුවන් වුණා පළමු අන්ඩර්ටේකින් එක ලබාගන්න. ඒ නිසා තමයි අපට අයි.එම්.එෆ්. එකේ පළමුවැනි වාරිකය නිදහස් කර ගන්න පුළුවන් වුණේ. අපට හැකියාව ලැබිලා තියෙනවා ලබන 12වැනිදා වනවිට බොහෝ විට අයි.එම්.එෆ්. එකේ බෝඩ් එකට යයි. ඒ අනුව අයි.එම්.එෆ්. එකේ දෙවැනි වාරිකය ලැබීමේ විශාල සම්භාවිතාවක් තියෙනවා. ඒක තමයි මේ රට බංකොලොත්භාවයෙන් මුදාගැනීමට තබන අඩිතාලම. ඒක ඉබේ සිදුවුණු දෙයක් නෙවෙයි."




# පාස්කු ප්‍රහාරයට පෙර බුද්ධි තොරතුරු 7ක් දීලා

දිනේෂ් සමරකෝන්

මෙරට සිදු වූ පාස්කු ප්‍රහාරය සිදුවීමට ආසන්න දින කිහිපයකදී, එවැනි ත්‍රස්ත ප්‍රහාරයක් එල්ල විය හැකි බවට බුද්ධි අංශ වෙත ලැබුණු බුද්ධි තොරතුරු අවස්ථා 7කදී රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂකව සිටි නිලන්ත ජයවර්ධන විසින් නිලධාරීන්ට ලබා දී ඇති බවට පාර්ලිමේන්තුවේදී තොරතුරු හෙළි විය.

අදාළ සිදුවීම සම්බන්ධයෙන් 2019.04.04, 2019.04.18, 2019.04.20 සහ 2019.04.21 යන දින හතර තුළ තොරතුරු ලැබී ඇති බවට සභානායක අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත් මහතා ඊයේ (07දා) පාර්ලිමේන්තුවේදී පැවසීය.

එලෙස ලැබුණු සියලු බුද්ධි තොරතුරු රාජ්‍ය බුද්ධි සේවාවේ හිටපු අධ්‍යක්ෂ නිලන්ත ජයවර්ධන මහතා විසින් පහත සඳහන් පරිදි දැනුම්දී ඇති බව වාචික පිළිතුරු අපේක්ෂාවෙන් සමගි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී හෙක්ටර් අප්පුහාමි මහතා යොමු කළ ප්‍රශ්නයකට ආරක්ෂක රාජ්‍ය අමාත්‍යවරයා වෙනුවට පිළිතුරු ලබාදෙමින් අමාත්‍යවරයා මේ බව සඳහන් කළේය.

අවස්ථා 07කදී බුද්ධි තොරතුරු පහත සඳහන් පරිදි රාජ්‍ය බුද්ධි සේවාවේ හිටපු අධ්‍යක්ෂ නිලන්ත ජයවර්ධන මහතා විසින් අදාළ නිලධාරීන් දැනුවත් කර තිබේ.

2019.04.07 දින S 1612/2019 දරන ලිපිය මගින් 2019.04.04 දින විදේශ බුද්ධි ආයතනයක් වෙතින් ලබාදුන් බුද්ධි තොරතුර දැනගැනීම හා උපදෙස් පතා ජාතික බුද්ධි ප්‍රධානී සිසිර මෙන්ඩිස් මහතා වෙත ලිඛිතව යොමු කර ඇත,

2019.04.04 දින විදේශ බුද්ධි ආයතනයකින් ලද තොරතුරු විශ්ලේෂණය කිරීමෙන් පසු ප්‍රහාරය පිළිබඳ තොරතුරු 2019.04.09 දින අංක S 1612/2019 දරන ලිපිය මගින් පොලිස්පති පූජිත් ජයසුන්තර මහතා හා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවී සෙනවිරත්න මහතා වෙත ලිඛිතව දැනුවත් කර ඇත,

2019.04.18 දින අංක S 1758/2019 දරන ලිපිය මගින් 2019.04.16 දින තාලංකුඩා ප්‍රදේශයේ යතුරුපැදියක් පුපුරවා හැරීම සහරාන්ගේ ජාලයට සම්බන්ධිතයන් විසින් යම් පිපිරීමක් සිදුකිරීමට පෙර සිදුකරන ලද පුපුරන ද්‍රව්‍ය අත්හදා බැලීමක් බවට පොලිස්පති පූජිත් ජයසුන්දර මහතා හා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවී සෙනවිරත්න මහතා ලිඛිතව දැනුවත් කර ඇත,

2019.04.19 දින අංක S 1758/2019 දරන ලිපිය මගින් තාලංකුඩා යතුරුපැදිය පුපුරවා හැරීම සම්බන්ධ වැඩිදුර වාර්තාව සහ සහරාන් ජාලය සමග සම්බන්ධතා පවත්වන විදේශීය දුරකථන අංක සහිත වැඩිදුර වාර්තාවක් පොලිස්පති පූජිත් ජයසුන්දර මහතා හා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පත් රවී සෙනෙවිරත්න මහතා වෙත ලිඛිතව දැනුවත් කර ඇත,

2019.04.20 දින අංක S 1758/2019 දරන ලිපිය මගින් සහරාන් ගැවසෙන ප්‍රදේශ සහ ඔවුන්ගෙ ජාලයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ වැඩිදුර වාර්තාවක් මගින් පොලිස්පති පූජිත් ජයසුන්දර මහතා සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවී සෙනවිරත්න මහතා වෙත ලිඛිතව දැනුවත් කර ඇත,

2019.04.20 දින WhatsApp/ Text පණිවිඩ මගින් 2019.04.21 දින හෝ එම දිනට පෙර ඕනෑම වේලාවකදී ජාතික තව්හිද් ජමාත් සංවිධානයේ ක්‍රියාකාරිකයෙකු වන සහරාන් ඇතුළු කණ්ඩායමක් කතෝලික පල්ලි සහ හෝටල් ඉලක්ක කර ගනිමින් ඉස්ලාමය වෙනුවෙන් ස්වර්ගයට යාම සඳහා කරන ප්‍රහාරයක් (Isuishhad) දියත් කිරීමේ සූදානමක් පවතින බවත්, ප්‍රහාරයක් එල්ල කිරීම සඳහා අත්හදා බැලීමක් 2019.04.16 දින තාලංකුඩාහිදී සිදුකළ බවත් ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් හේමසිරි ප්‍රනාන්දු මහතා, පොලිස්පති පූජිත් ජයසුන්දර මහතා සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවී සෙනෙවිරත්න මහතා දැනුවත් කර ඇත,

2019.04.21 දින WhatApp පණිවිඩයක් මගින් ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් හේමසිරි ප්‍රනාන්දු මහතා හා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවී සෙනවිරත්න මහතා දැනුවත් කර ඇත.

මෙම සියලු තොරතුර ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් විශ්‍රාමික ජනරාල් කමල් ගුණරත්න මහතා විසින් ආරක්ෂක රාජ්‍ය අමාත්‍යවරයා වෙත ලබාදී තිබේ.

# වැස්ස නිසා වගාවලින් 40%ක් විනාශයි

## -ගස්ලබු, කෙසෙල්, කොමඩු සහ අමු මිරිස් මිල ඉහළට

ඉන්දික හේවාවිතාරණ

පැවති වැසි තත්ත්වය නිසා එළවළු හා පලතුරු වගාවලින් 40%කට වැඩි ප්‍රමාණයක් විනාශයට පත් වී තිබෙන බව ජාතික ගොවිජන එකමුතුව සඳහන් කරයි.

මේ නිසා කඩිනමින් වගා හානි තක්සේරුවක් සිදුකර ගොවිජනතාවට වන්දි ලබා දෙන ක්‍රමයක් ඇති කළ යුතු බවත්, එසේ නොමැති වුවහොත් ලබන අප්‍රේල් මාසය වනවිට එළවළු හා පලතුරු හිඟයක් ඇති වීම වළක්වාගත නොහැකි වන බවද එම සංගමයේ සභාපති අනුරාධ තෙන්නකෝන් මහතා සඳහන් කළේය.

උඩරට එළවළු වගාවට සහ පහතරට හා වියළි කලාපීය එළවළු හා පලතුරු වගාවට වර්ෂාව නිසා දැඩි ලෙස හානි සිදුව තිබෙන බවත් මේ නිසා එළවළු, අමු මිරිස් මිල සහ ගස්ලබු, කෙසෙල්, කොමඩු යන පලතුරු මිල ජනතාවට දරාගත නොහැකි ලෙස මේ වන විට ඉහළ ගොස් තිබෙන බවත් හෙතෙම පවසා සිටියේය.

යල කන්නයේදී ඇති වූ වියළි කාලගුණ තත්ත්වය නිසාත් එළවළු හා පලතුරු වගාවන්ට හානි සිදු වූ බවත් එහෙත් ඒ වෙනුවෙන් වන්දි ලබා දීම සිදුනොවූ බවද ඒ මහතා සඳහන් කළේය.

ඉන්පසුව කනකර උගස් කර හෝ ණයට මුදල් ලබා ගනිමින් මාස් කන්නයේ එළවළු හා පලතුරු වගාවන් සිදුකිරීමට ගොවීන් කටයුතු කළ බවත් මාස් කන්නයේ ගොවිතැනට වර්ෂාව නිසා හානි සිදුව තිබෙන බවද පවසා සිටියේය.

එම නිසා මෙම හානිවලට අදාළව වන්දි ලබා දීමට කටයුතු නොකළහොත් ජනවාරි මාසයේ සිට එළවළු හා පලතුරු වගා ආරම්භ කර ගැනීමට බොහෝ ගොවීන්ට නොහැකි වන බවත්, එවන් තත්ත්වයක් ඇති වුවහොත් අප්‍රේල් මාසය වනවිට එළවළු හා පලතුරු හිඟයක් ඇති වන බවත් සභාපතිවරයා සඳහන් කළේය.

# යළිත් දේශීය බිත්තර හිඟයක්

## ඇතැම් ප්‍රදේශවල බිත්තරයක මිල රු.55 දක්වා ඉහළට

එච් අයි තුෂාර

ඇතැම් ප්‍රදේශවල දේශීය බිත්තරයක සිල්ලර මිල මේ වන විට රුපියල් 55ක් දක්වා ඉහළ ගොස් තිබෙන අතර සමහර ප්‍රදේශවල බිත්තර හිඟයක්ද ඇති වී තිබේ.

සුදු පාට බිත්තරයක තොග මිල පවා ඇතැම් ප්‍රදේශවල රුපියල් 50ක් බවට පත් වී තිබෙන අතර දුඹුරු පැහැති බිත්තරයක තොග මිල රුපියල් 52ක් දක්වා ඉහළ ගොස් තිබෙන බවද සිල්ලර වෙළෙඳුන් සඳහන් කරති.

පසුගිය සතියේදී බිත්තරයක සිල්ලර මිල ලෙස සඳහන් වූයේ රුපියල් 40ත් රුපියල් 45ත් අතර මුදලක් වන අතර එහෙත් ඊයේ දිනය වන විට ඇතැම් ප්‍රදේශවල බිත්තරයක සිල්ලර මිල රුපියල් 55ක් දක්වා ඉහළ ගොස් තිබිණි. ඇතැම් ගොවිපළවල ජලයෙන් යට වීම නිසා හා සත්ත්ව ආහාර කිලෝවක මිල රුපියල් 190 සිට රුපියල් 230 දක්වා ඉහළ යාම නිස බිත්තර සැපයුම්වලට බාධා සිදුවෙමින් තිබෙන බව සමස්ත ලංකා කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ගේ සංගමය සඳහන් කරයි.

සමහර ගොවිපළවල් සති ගණනක් ජලයෙන් යට වී තිබූ බවත් මේ නිසා සතුන්ට ආහාරපාන සැපයීමට හා බිත්තර එකතු කර ගැනීමට බාධා තිබූ බවත් පැවැති වැසි තත්ත්වය නිසා බිත්තර ප්‍රවාහනයටත් බාධා සිදු වූ බවද එම සංගමයේ සභාපති නිරුක්ෂ කුමාර මහතා සඳහන් කළේය.

මේ වන විට දෛනිකව බිත්තර ලක්ෂ පනස්පහත්, ලක්ෂ හැටත් අතර ප්‍රමාණයක් අවශ්‍ය බවත් එහෙත් වෙළඳ පොළට පැමිණෙන්නේ බිත්තර ලක්ෂ පනහකට ආසන්න ප්‍රමාණයක් බවත් මේ නිසා සමහර ප්‍රදේශවල බිත්තර හිඟයක් නිර්මාණය වී තිබෙන බවද පවසා සිටියේය.

# 'ලෝක සාමය' වෙනුවෙන් විපක්ෂනායක සාටකයක් පලඳියි

දිනේෂ් සමරකෝන්

'ලෝක සාමය' වෙනුවෙන් සාටකයක් පැලඳ විපක්ෂනායක සජිත් ප්‍රේමදාස මහතා ඊයේ (07දා) පාර්ලිමේන්තුවේ පැවති විදේශ කටයුතු අමාත්‍යාංශයේ සහ කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ කාරක සභා විවාදයට එක්ව සිටියේය.

ලෝක සාමය තිබීම ලෝක ස්ථාවරත්වයට හේතුවක් වන බව එහිදී අදහස් පළ කරමින් විපක්ෂනායකවරයා පැවසීය.

එමෙන්ම මෙරට තුළත් සාමය ස්ථාපිත කළ යුතු බව සඳහන් කළ විපක්ෂනායක සජිත් ප්‍රේමදාස මහතා,

"පලස්තීන - හමාස් අර්බුදයේ දෙපැත්තෙම ඉන්න කණ්ඩායම් සිවිල් ප්‍රජාව පලිහක් කරගෙන එල්ල කරන්නා වූ දැවැන්ත ප්‍රහාර සියල්ලක්ම අපි ප්‍රතික්ෂේප කරනවා. මම මේ පලඳනාව ඇඳගෙන එද්දි උතුර නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් ඇහුවා පලස්තීනය නියෝජනය කරලද මේ පලඳනාව පලඳන් එන්නේ කියලා. මම කිව්වා නෑ කියලා. මම මේක අඳින්නේ ලෝක සාමය වෙනුවෙන්. මොකද ලෝක සාමයෙන් තමයි ලෝක ස්ථාවරත්වයක් ඇති වෙන්නේ. මම පැහැදිලිව කියන්න ඕන රට තුළ සාමය ස්ථාපිත කරන්නටත්, අපේ රටේ ජාතිවාදය, ජාති භේදය, ආගම්වාදය ආගම් භේදය කුමන ජන කොට්ඨාසය ක්‍රියාත්මක කළත් අපි ඒක තරයේ ප්‍රතික්ෂේප කරනවා. අපට අවශ්‍ය ශ්‍රී ලාංකිකත්වය සහ සද්ජාතිකත්වය."

# අධිවේගී මාර්ගවලින් STF ඉවතට?

බණ්ඩාරගම - බිමල් ශ්‍යාමන් ජයසිංහ

අධිවේගී මාර්ගයන්හි රාජකාරි සිදුකරන පොලිස් විශේෂ කාර්ය බළකා සෙබළුන් එම සේවාවලින් ඉවත් කර ගැනීමේ සූදානමක් පවතින බව වාර්තා වේ.

එවැනි තත්ත්වයක් ඇති වුවහොත් අධිවේගී මාර්ගය භාවිත කරන්නන්ගේ ජීවිත දැඩි අනාරක්ෂිත තත්ත්වයකට පත්වීම නොවැළැක්විය නොහැකි වන බව මාර්ග සංවර්ධන අධිකාරියේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පැවසීය.

ඊට හේතුව වශයෙන් ඔහු සඳහන් කළේ අධිවේගී මාර්ගයේ වාහනයක් හදිසි අනතුරකට ලක් වූ අවස්ථාවකදී යම් ගිනි ගැනීමක් ඇති වුවහොත් වාහනය තුළ සිරවී සිටින පුද්ගලයන් ක්ෂණිකව ඉවතට ගැනීමේ මෙන්ම ගිනි නිවීමේ හා වෛද්‍ය ප්‍රතිකාර ලබාදීමේ මනා පුහුණුවකින් සමන්විත එම සෙබළු ඉවත් කිරීම දැඩි ගැටලුසහගත තත්ත්වයක් බවයි.

අධිවේගී මාර්ගය ආරම්භ කර ගෙවී ගිය වසර 12 තුළ ජීවිත සිය ගණනක් බේරාගත් එම සෙබළු සිදුකළ කාර්ය මිල මුදලින් මැනිය නොහැකි බව මාර්ග සංවර්ධන අධිකාරියේ එම ජ්‍යෙෂ්ඨ නිලධාරියා වැඩිදුරටත් පැවසීය.

මේ වනවිට කටුනායක සිට මත්තල දක්වා සීදූව, ගැලනිගම, කුරුඳුගහ, පින්නදූව සහ සූරියවැව අධිවේගී පිවිසුම් මධ්‍යස්ථාන 5ක විශේෂ කාර්ය බළකා සෙබළුන් 200කට ආසන්න ප්‍රමාණයක් සේවය කරන අතර මේ දක්වා අධිවේගී මාර්ගය තුළ කිසිදු අපරාධයකට හෝ පාතාල ක්‍රියාවකට හිස එසවීමට අවකාශයක් ලැබී නැත්තේ එම සෙබළුන් රාජකාරියට එහා ගිය සේවාවක් සිදුකරමින් මගීන්ගේ ආරක්ෂාව මනා ලෙස තහවුරු කර ඇති බැවිනි.

අධිවේගී මාර්ගය ආරම්භ කළ කාලවකවානුවලදී එහි ගමන් ගන්නා වාහනවලට ගල් ප්‍රහාර එල්ල කළ පුද්ගලයන් අත්අඩංගුවට ගෙන එම ව්‍යසනය මුලිනුපුටා දමා වාහනවල ආරක්ෂාව තහවුරු කිරීමට කටයුතු කෙරිණි.

එතනින් නොනැවතුණු ඔවුන් ක්ෂණික මාර්ග බාධක දමා පිවිසුම්වලදී වාහන පරීක්ෂාවද සිදු කිරීම අපරාධ අවම කිරීමට ගත් තවත් එක් පියවරකි.

දෛනිකව අධිවේගී මාර්ගය පාවිච්චි කරන්නන්ගේ ජීවිත ආරක්ෂා කරන පොලිස් විශේෂ කාර්ය බළකා සෙබළුන් පාතාලය මර්දනය කිරීමට යැයි පවසා අධිවේගී මාර්ග සේවාවෙන් ඉවත් කිරීම සඳහා මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ලිඛිතව ඉල්ලීමක් කර ඇති බවටද වැඩිදුරටත් දැනගන්නට ඇත.

මේ පිළිබඳ මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් එල්.ඊ.එස්. වීරකෝන් මහතාගෙන්වූ මසීමේදී මෙසේ පැවසීය.

"ඔව්, පොලිස් විශේෂ කාර්ය බළකා සෙබළුන් අධිවේගී මාර්ග රාජකාරිවලින් ඉවත් කර ගැනීමට සූදානමක් පවතිනවා. අප ඉල්ලීමක් කර තිබෙනවා ඔවුන් ඒ ආකාරයෙන්ම රඳවා තබන්න කියලා. ඒ සම්බන්ධයෙන් මේ වන විට සාකච්ඡා පැවැත්වෙනවා" යනුවෙනි.

# උතුරු පොල් ත්‍රිකෝණයේ පැළ සිටුවීමේ හමුදා ක්‍රියාන්විතය ඇරඹෙයි

## වන්නි බලප්‍රදේශය තුළ පොල් පැළ ලක්ෂයක් රෝපණය කිරීම අරමුණයි

ඉන්දික හේවාවිතාරණ

ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතාගේ යෝජනාවකට අනුව ක්‍රියාත්මක කරන දෙවැනි පොල් ත්‍රිකෝණය උතුරට යන වැඩපිළිවෙළ යටතේ වන්නි බලප්‍රදේශය තුළ පොල් පැළ ලක්ෂයක් රෝපණය කිරීම ආරම්භ කර තිබෙන බව යුදහමුදා මූලස්ථානය සඳහන් කරයි.

මේ අනුව අනුරාධපුර, වවුනියාව හා මන්නාරම යන දිස්ත්‍රික්ක මූලික කරගනිමින් පොල් පැළ සිටුවීම සිදුකරන බවත් මේ සඳහා උනන්දුවක් දක්වන ජනතාවට පොල් පැළ හා අනෙකුත් පහසුකම් ලබා දීම සිදුකරන බවත් පෙන්වා දෙයි.

මෙම වැඩසටහන යටතේ මේ වන විට පොල් පැළ විසිපන්දහසක් ජනතාව වෙත නොමිලේ ලබා දී තිබෙන බවත් ප්‍රවාහන පහසුකම් නොමැති පිරිස් සඳහා පොල් පැළ ලබා දීමට ජංගම සේවාව පවත්වමින් පොල් පැළ ලබා දෙමින් තිබෙන බවද යුදහමුදා මූලස්ථානය සඳහන් කරයි.

ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් දිනේෂ් නානායක්කාර මහතාගේ මගපෙන්වීම යටතේ මෙම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරන අතර මේ සඳහා පොල් සංවර්ධන මණ්ඩලය, මහජන බැංකුව හා ටෝපිකෝර් ලංකා පුද්ගලික ආයතනය අනුග්‍රහය දක්වන බවද පෙන්වා දෙයි.

මෙම වැඩපිළිවෙළ යටතේ පොල්පැළ නොමිලේ ලබා දීමට අමතරව පොහොර සහනාධාර හා වගා කිරීමට අවශ්‍ය වන මුදල් අඩු පොලී අනුපාත යටතේ වගාකරුවන්ට ලබා දෙන වැඩපිළිවෙළක්ද ක්‍රියාත්මක කර තිබේ.

ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) මගින් සපයා දෙනුලබන පොල් පැළ අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ 21වන පාබල සේනාංකය මගින් හා මන්නාරම් දිස්ත්‍රික්කය තුළ 54වන පාබල සේනාංකය මගින් හා මන්නාරම් දිස්ත්‍රික්කය තුළ 56වන සේනාංකය මගින් බෙදා දීම සිදුකරනු ලබයි.

# පොහොට්ටුවේ ජනපති අපේක්ෂක ලැයිස්තුවට නම් 4ක්

## ජනපති රනිලුත් ඒ අතර, අවසන් තීරණය බැසිල් අත ?

නිදර්ශනී වික්‍රමසිංහ

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි මීළඟ ජනාධිපති ධුර අපේක්ෂකයා කවුරුන්ද යන්න පිළිබඳ වූ අවසන් තීරණය එහි ජාතික සංවිධායක බැසිල් රාජපක්ෂ මහතා විසින් ගනු ඇති බවත්, එසේම ඊට සුදුසු බවට තිදෙනෙකුගේ නම් ප්‍රකාශ වී ඇති බවත් එම පක්ෂයේ අභ්‍යන්තර ආරංචිමාර්ග සඳහන් කරයි.

ඒ අනුව බැසිල් රාජපක්ෂ, ධම්මික පෙරේරා යන මහත්වරුන් මෙන්ම නාමල් රාජපක්ෂ මහතාද පක්ෂය වෙනුවෙන් අදාළ සුදුස්සන් වන බවට එම ප්‍රධානීන් අතර සාකච්ඡා වී ඇති බව සඳහන් වේ. මෙහිදී තරුණ නායකත්වයක් රටට අවශ්‍ය බවට යන කතිකාව හේතුවෙන් නාමල් රාජපක්ෂ මහතාට පක්ෂයේ අවධානය යොමුව තිබේ.

කෙසේවුවද, වත්මන් ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා මීළඟ ජනාධිපති අපේක්ෂකයා බවට පත් කිරීමට ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ යළි තීරණය කිරීමටද හැකියාව ඇති බවත්, එහෙත් ඒ පිළිබඳ මේ වන තෙක් පක්ෂයක් ලෙස අවසන් තීරණයක් ගෙන නොමැති බවත් සඳහන් වේ.

ඒ අනුව එම තීරණය බැසිල් රාජපක්ෂ මහතා සහ ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා අතර පැවැත්වෙන වැඩිදුර සාකච්ඡාවලින් අනතුරුව රාජපක්ෂ මහතා විසින් පක්ෂයට දැනුම්දීමට නියමිත බව පක්ෂ අභ්‍යන්තර ආරංචිමාර්ග වැඩිදුරටත් පවසා සිටියි.

# පිළිකා රෝගීන්ගේ ගිණුම්වලින් ලක්ෂ 250ක් වංචා කළ 3ක් රිමාන්ඩ්

## රෝගීන්ගේ හැඳුනුම්පත් අංකවලින් සිම්පත් ලබාගෙන ඔවුන්ගේ බංකු ගිණුම්වලට ඇතුල් වෙලා

● බණ්ඩාරගම බිමල් ශ්‍යාමන් ජයසිංහ

20 හැවිරිදි තරුණයෙකුගේ ඇට මිදුළු බද්ධ කිරීමේ ශල්‍යකර්මයකට මුදල් ආධාර දෙන මුවාවෙන් ඔහුගේ බැංකු හා පෞද්ගලික තොරතුරු ලබාගෙන අන්තර්ජාලය ඔස්සේ ඔහුගේ බැංකු ගිණුමට ප්‍රවිෂ්ට වී රුපියල් ලක්ෂ 38ක මුදලක් වංචා කිරීමේ සිද්ධියට පොලිස් පරිගණක අපරාධ කොට්ඨාසය අත්අඩංගුවට ගත් එකම පවුලේ සහෝදරියන් දෙදෙනෙක් ඇතුළු තිදෙනා ලබන 19වැනිදා දක්වා රක්ෂිත බන්ධනාගාරගත කිරීමට කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් ප්‍රසන්න අල්විස් මහතා ඊයේ (07දා) නියෝග කර තිබේ.

සැකකාරියන් දෙදෙනා ජා-ඇල ප්‍රදේශයේදීත් සැකකරු ගම්පහ වෑබඩ ප්‍රදේශයේදීත් අත්අඩංගුවට ගෙන ඇත.

රිමාන්ඩ් භාරයට පත් ගත් සැකකරු 35 හැවිරිදි පුද්ගලයෙකු බවත් සැකකාරියන් වයස අවුරුදු 19, 22 අතර පසුවන්නන් බව පොලීසිය සඳහන් කරයි. සැකකරු සැකකාරියන්ගේ මවගේ අනියම් ස්වාමිපුරුෂයා බවද පොලීසිය පවසයි.

එම කල්ලිය විසින් එම මුදලින් මිලදී ගෙන තිබූ රන් අත්පළඳනාවක්, රන්මාල හතරක් ඇතුළු දේපොළ මෙන්ම වංචාවට යොදාගත් බැංකු පොත් කිහිපයක් බැංකු පාස් පොත්, විවිධ භාණ්ඩ මිලදීගත් රිසිට්පත් තොගයක් පොලිස් භාරයට ගෙන ඇත.

හලාවත කුඩා මඩු වැල්ලේ පදිංචි 20 හැවිරිදි ලියුකේමියා රෝගයෙන් පෙළෙන තරුණයෙකු 2021 වර්ෂයේ සිට අතර ඔහු මේ වනවිට මහරගම අපේක්ෂා රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටින බව පොලීසිය සඳහන් කරයි.

ඔහු පරීක්ෂා කළ විශේෂඥ වෛද්‍යවරුන් පවසා ඇත්තේ හැකි ඉක්මනින් ඇටමිදුළු බද්ධ කිරීමේ ශල්‍ය කර්මයක් කළ යුතු බවය.

එය පෞද්ගලික රෝහලක කළ යුතු බැවින් ඒ සඳහා රුපියල් ලක්ෂ 150ක් වැනි අතිවිශාල මුදලක් වැය වෙතැයි පැවසීමෙන් අනතුරුව ඔහුගේ මිතුරන් විසින් ඒ බව පවසා දුරකථන අංකයක් ද සමග සමාජ මාධ්‍ය වෙත මුදා හැර ඔහුට උපකාර කරන මෙන් ඉල්ලීමක් කරමින් තිබූ බව පොලීසිය කියයි.

ඒ අනුව මීට දින කීපයකට ඉහතදී එම ශල්‍යකර්මයට උදව් කරන මුවාවෙන් ඇමතුමක් ලබාගෙන තිබූ පුද්ගලයකු රුපියල් ලක්ෂ දෙකක මුදලක් ශල්‍යකර්මයට ලබා දිය හැකි බව පවසා හැඳුනුම්පතේ කොපියක් හා බැංකු පොතේ කොපියක් සහ ගිණුම් අයිතිකරුගේ අත්සන සහිත ලිපියක්ද එවන ලෙස කළ දැනුම්දීමක් අනුව එම ලිපිලේඛන එම පුද්ගලයාට යොමු කර තිබූ බව පොලිස් විමර්ශනවලදී අනාවරණය වී ඇත.

දින කිහිපයක් ගතවෙද්දී සිය බැංකු ගිණුමට විදේශගතව සිටින සහ මෙරට සිටින විවිධ පරිත්‍යාගශීලීන් වරින්වර මුදල් තැන්පත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස රුපියල් ලක්ෂ 70ක මුදලක් තැන්පත් වූ බවත් එම මුදලින් හිටිහැටියේම රුපියල් ලක්ෂ 38ක් අඩුවී ඇති බව පවසමින් එම තරුණයා පරිගණක අපරාධ කොට්ඨාසයට කරන ලද පැමිණිල්ලක් අනුව සිදු කළ විමර්ශනවලදී මෙම වංචාකාරී කල්ලිය අත්අඩංගුවට ගැනීමට හැකිවූ බවද පොලීසිය කියයි

එම කල්ලිය විසින් එකී බැංකු ගිණුමේ මුරපදය ලබාගෙන මුදල් ලබා ගැනීම එක් වරක් පමණක් සිදු කර ඇති බවත් බහුතරයක් සිදුකර ඇත්තේ රන් ආභරණ සහ වටිනා දුරකථන, ටැබ් සහ ලැප්ටොප් පරිගණක මිලදී ගැනීම පමණක් බව පොලීසිය සඳහන් කරයි.

මේ ආකාරයෙන් මෙම කල්ලිය විසින් විවිධ රෝගාබාධ සඳහා සමාජ මාධ්‍ය හරහා ආධාර ඉල්ලා දැන්වීම් පළ කළ පුද්ගලයන්ට ආධාර මුදල් ලබාදෙන මුවාවෙන් ඔවුන්ගේ බැංකු ගිණුම් සහ පෞද්ගලික තොරතුරු ලබාගෙන අන්තර්ජාලය ඔස්සේ හොර රහසේ ඇතුළු වී රුපියල් කෝටි දෙකහමාරක පමණ මුදල් වංචා කර ඇතැයි එම නිලධාරියා පවසා සිටියේය.

මෙම කල්ලියේ ප්‍රධාන සැකකරු ගෙවල් බිඳුම් රැසකට සම්බන්ධ වූවෙකු බවද පොලීසිය කියයි.

පරිගණක අපරාධ කොට්ඨාසය සිද්ධිය පිළිබඳ වැඩිදුර පරීක්ෂණ පවත්වයි.

# කතරගම දේවාලයට පූජා කළ පවුම් 30ක රන් තැටිය සොරාගත් සැකකරුවන් අත්අඩංගුවට ගැනීමට පරීක්ෂණ

● බණ්ඩාරගම - බිමල් ශ්‍යාමන් ජයසිංහ

ඓතිහාසික කතරගම දේවාලයට බැතිමතෙකු විසින් පූජා කරන ලද රන්තැටිය අස්ථානගත වීම සම්බන්ධයෙන් විමර්ශන පවත්වා සැකකරුවන් සිටී නම් අත්අඩංගුවට ගන්නා ලෙස නීතිපතිවරයා විසින් කොළඹ අපරාධ කොට්ඨාසය වෙත දැනුම්දී ඇති බව පොලිස් ආරංචි මාර්ග සඳහන් කරයි.

මීට වසර කීපයකට පෙරදී පවුම් තිහක (ග්‍රෑම් 240), බර ප්‍රමාණයකින් යුත් රන්තැටියක් බැතිමතෙකු විසින් ප්‍රධාන කපු මහතා සේවාවේ යෙදී සිටියදී පූජා කර තිබූ අතර, එය අස්ථානගත වී ඇති බව කතරගම බස්නායක නිලමේවරයා විසින් කොළඹ අපරාධ කොට්ඨාසය වෙත පැමිණිලි කර තිබිණි.

එම විමර්ශන ආරම්භ කිරීමත් සමගම බැතිමතා විසින් පූජා කරන ලද රන් තැටියට සමාන ලෙස සැකසූ රන් තැටියක් දේවාලය වෙත තබා තිබිණි

ඒ සම්බන්ධයෙන් කොළඹ අපරාධ කොට්ඨාසය මගින් නීතිපතිවරයාගේ උපදෙස් ඉල්ලා ගොනුවක් යොමු කර තිබිණි.

කොළඹ අපරාධ කොට්ඨාසයේ අධ්‍යක්ෂ සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා මහතාගේ උපදෙස් මත ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ඇන්සලන් ද සිල්වා මහතාගේ මෙහෙයවීමෙන් ඒකකයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක එස්.පී.පී.ජේ. නිශාන්ත මහතාගේ මූලිකත්වයෙන් පරීක්ෂණ පැවැත්වීමට නියමිතය.

# ෆේස්බුක් පෙම්වතා හමුවූ පළමු දිනයේම අපයෝජනයට ලක්වුවැයි සිසුවියක් දිවි නසාගෙන

## සැකකාර ෆේස්බුක් පෙම්වතා රිමාන්ඩ්

● ලුණුගල - ප්‍රසන්න පත්මසිරි/ බදුල්ල - පාලිත ආරියවංශ

ෆේස්බුක් ඔස්සේ හඳුනාගත් පෙම්වතිය අපයෝජනය කළැයි කියන එම සිසුවියකගේ සැකකාර පෙම්වතා බදුල්ල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එළැඹෙන 20වැනිදා දක්වා රක්ෂිත බන්ධනාගාරගත කරන ලෙස බදුල්ල මහේස්ත්‍රාත්වරයා ඊයේ (07දා) නියෝග කළේය.

මෙලෙස රක්ෂිත බන්ධනාගරගත කෙරුණේ, 23 හැවිරිදි සැකකාර පෙම්වතා බදුල්ල, සොරණාතොට පදිංචිකරුවෙකි.

ෆේස්බුක් ඔස්සේ හඳුනාගත් පෙම්වතා හමුවූ ප්‍රථම දිනයේදීම ඔහු විසින් අපයෝජනයට ලක්වීම නිසා සිත්තැවුලට පත් පාසල් සිසුවියක පසුගිය 05වැනිදා සියදිවි නසාගෙන ඇතැයි බදුල්ල මූලස්ථාන පොලීසිය සඳහන් කරයි.

බදුල්ල ප්‍රදේශයේ පාසලක 11 වසරේ ඉගෙනුම ලබන ශිෂ්‍යාවක මෙසේ සියදිවි හානිකර ගෙන ඇත.


පසුගිය 03වැනිදා උපකාරක පන්තියකට ගිය සිසුවිය ෆේස්බුක් ඔස්සේ හඳුනාගත් තම පෙම්වතා සමග ත්‍රිරෝද රථයකින් බදුල්ල සරුංගල් කන්දට ගොස් පෙම්සුව විඳිමින් සිටියදී සැකකරු ඇය අපයෝජනයට ලක් කර තිබෙන බව පරීක්ෂණවලදී තහවුරු කරගෙන තිබේ.

අනතුරුව අදාළ සිසුවිය එදින සවස නිවසට පැමිණ ඇගේ මිත්තණිය අධිරුධිර පීඩනයට ගන්නා ඖෂධ වැඩිපුර පානය කිරීමෙන් පසු ඇතිවූ රෝගී තත්ත්වයක් මත බදුල්ල ශික්ෂණ රෝහලට ඇතුළත් කිරීමෙන් පසු පෙරේදා (05දා) මිය ගොස් ඇතැයි පොලීසිය පවසයි.

ඇය විසින් ඇගේ මවගේ ජංගම දුරකථනයට පණිවිඩයක් යවා ඖෂධ පානය කිරීමෙන් සියදිවි නසා ගෙන තිබේ.


මියගිය සිසුවියගේ පශ්චාත් මරණ පරීක්ෂණය බදුල්ල ශික්ෂණ රෝහලේදී පවත්වා ඇය අපයෝජනයට ලක්ව සිටින බවට වාර්තාවක් ඉදිරිපත් කර තිබෙන බව පොලීසිය සඳහන් කරයි.

මියගිය සිසුවියගේ අවසන් කටයුතු පෙරේදා (06දා) සිදු කර තිබිණි.




# රු. ලක්ෂ 170කට ගජමුතුවක් අලෙවි කිරීමට තැත් කල දෙදෙනෙකු දැලේ

● ජා-ඇල ප්‍රසංග පෙරේරා/තිස්ස කොටින්කඩුව



රුපියල් ලක්ෂ 170කට ගජමුතුවක් අලෙවි කිරීමට සූදානම් වූ පුද්ගලයන් දෙදෙනෙකු අත් අඩංගුවට ගත් බව ජා-ඇල පොලීසිය පවසයි.

අම්පාර, ඉගිනියාගල පදිංචි 51 හැවිරිදි පුද්ගලයෙකු හා මතුගම, බදුරලිය පදිංචි 36 හැවිරිදි පුද්ගලයෙක් මෙසේ අත්අඩංගුවට පත්ව සිටිති.

ජා-ඇල පොලිස් ස්ථානයේ විශේෂ කාර්යංශයේ හා බුද්ධි නිලධාරින්ගෙන් ලද සාර්ථක තොරතුරකට අනුව පොලිස් නිලධාරීන් විසින් මෙම වැටලීම සිදු කර සැකකරුවන් අත්අඩංගුවට ගෙන තිබිණි. අත්අඩංගුවට පත් සැකකරුවන්ගෙන් එක් අයෙකු තැරව්කරු බවද පොලීසිය පවසයි. ජා-ඇල පොලීසිය සිද්ධිය පිළිබඳ වැඩිදුර පරීක්ෂණ සිදු කරයි.

# මාතර අධිකරණයෙන් අතුරුදන්වූ තවත් ගිනි අවියක් හමුවේ

● ක්‍රිෂාන් ජීවක ජයරුක්



මාතර මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු බඩු ගබඩා කාමරයෙන් සොරකම් කර පිටතට විකිණීමට රැගෙන යාමට සූදානම් කර තිබු තවත් ගිනිඅවියක් එම කාමරයේ වෙනත් ස්ථානයක ගෝනියක් තුළ සඟවා තිබියදී ඊයේ (07දා) සොයා ගත් බව මාතර කොට්ඨාස අපරාධ විමර්ශන ඒකකය පවසයි.

දැනට රැඳවුම් නියෝග යටතේ ප්‍රශ්න කරමින් පවතින එම අධිකරණයේ සේවය කළ බහුකාර්ය සංවර්ධන නිලධාරීන් තිදෙනාගෙන් හෙළි කරගත් තොරතුරු නඩු බඩු කාමරයේ ගෝනියක් තුළ සඟවා තිබියදී ගිනිඅවිය පොලිස් භාරයට ගෙන තිබේ.

ඇසෙරිකාවේ නිෂ්පාදිත මිලිමීටර් 9.9 වර්ගයේ උණ්ඩ යෙදිය හැකි එම ගිනි අවිය 2014 වසරේදී මාතර තුඩාවේ සිදුකළ මනුෂ්‍ය ඝාතනයකට යොදා ගත් ගිනි අවියක් බව මූලික පරීක්ෂණවලදී අනාවරණය වී ඇත.

මාතර පොලිස් ඉතිහාසයේ දින හතරක් තුළ ගිනිඅවි 05ක් සොයා ගත් ප්‍රථම අවස්ථාව මෙය බව උසස් පොලිස් නිලධාරියෙක් පැවසීය.

මාතර මහේස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර් විසින් ඉකුත් ජූලි මස 12වැනිදා නඩු බඩු කාමරයේ හෙරෝයින් පාර්සල් දෙකක් අතුරුදන්ව ඇති බවට මාතර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී පණ්ඩුල වීරසිංහ මහතා වෙත කරන ලද පැමිණිල්ලකට අනුව කොට්ඨාස අපරාධ විමර්ශන ඒකකයේ ස්ථානාධිපති විපුල ධම්මික මහතා ඇතුළු කණ්ඩායමක් පරීක්ෂණ ආරම්භ කර තිබේ.

# සූදු පිටියකට කඩා වැදුණු දෙදෙනෙකු සිදුකළ තියුණු ආයුධ ප්‍රහාරයකින් අයෙක් මරුට

● කටුනායක ටී.කේ.ජී.කපිල

සීදූව ලියනගේමුල්ල ප්‍රදේශයේ අවමංගල්‍ය නිවසක් ඉදිරිපිට පැවැති සූදු පිටියකදී තියුණු ආයුධ ප්‍රහාරයට ලක්වූ පුද්ගලයෙකු ජීවිතක්ෂයට පත්ව ඇතැයි සීදූව පොලීසිය පවසයි.

කටුනායක, කොළඹ පාර, පදිංචි ඉරෝෂන් රජීන්ද්‍ර ප්‍රනාන්දු (46) නමැත්තෙකු මෙම සිද්ධියෙන් ජීවිතක්ෂයට පත්ව ඇත.

මොහු කටුනායක ප්‍රදේශයේ කාමර කුලියට දෙන ස්ථානයක් සහ අවන්හලක් පවත්වාගෙන ගොස් ඇතැයි පොලීසිය පවසයි.


මොහුට එරෙහිව මීගමුව මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වන මිනීමැරුම් නඩු දෙකක් පවතින බවත් මොහු පුරුද්දක් වශයෙන් ප්‍රදේශයේ අවමංගල්‍ය නිවෙස්හි රාත්‍රී කාලයේ මුදල් ඔට්ටුවට සූදු සෙල්ලම් කරන අයෙකු බවත් පොලීසිය පැවසීය.

සීදූව, ලියනගේ මුල්ල ප්‍රදේශයේ අවමංගල්‍ය ඉදිරිපිට එසේ සූදු ක්‍රීඩාවේ නිරත වෙමින් සිටියදී, යතුරුපැදියකින් පැමිණි නාඳුනන පුද්ලයන් දෙදෙනෙකු, තියුණු ආයුධවලින් පහරදී සැකකරු ඝාතනය කර තිබිණි.

සිද්ධියට සම්බන්ධ කිසිවෙකුත් මේ වනවිට අත්අඩංගුවට ගෙන නොමැත. සීදූව පොලීසිය සිද්ධිය පිළිබඳ වැඩිදුර පරීක්ෂණ සිදු කරයි.

## අමරකීර්ති ඝාතන නඩුව

# ත්‍රිපුද්ගල මහාධිකරණ විනිසුරු මඬුල්ල ඝාතනය සිදුවූ ප්‍රදේශයේ නිරීක්ෂණය කරයි





● වාරණ ආනන්ද ඉ ජයකොඩි.

අමරකීර්ති ඝාතන නඩුවේ විශේෂ ත්‍රිපුද්ගල මහාධිකරණ විනිසුරු මඬුල්ල ඊයේ (07දා) පස්වරුවේ නිට්ටඹුව නගරයේ ඝාතනය සිදු වූ බව කියන නිහාල් පැෂන් ආයතනය ඇතුළු අවට ප්‍රදේශය නිරීක්ෂණය කිරීමක නිරත වූහ.

ගෝඨා ගෝ ගමට හා මයිනා ගෝ ගමට මැර ප්‍රහාරයක් එල්ල වූ පසුගිය වසරේ මැයි මස 09වනදා පස්වරුවේ නිට්ටඹුව නගරයේ දී හටගත් මහජන නොසන්සුන්තාවන් අතරතුරදී පොළොන්නරුව හිටපු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී අමරකීර්ති අතුකෝරල හා ඔහුගේ ආරක්ෂක පොලිස් සැරයන් අහංගම විතානරලාගේ ජයන්ත ගුණවර්ධන යන දෙදෙනා ඝාතනය කොට තිබිණ.

මේ පිළිබඳ නඩු විභාගය සහන් මාපා බණ්ඩාර (සභාපති), රශ්මි සිංගප්පුලි හා ඩී ඒ රුවන් පතිරණ යන ගම්පහ විශේෂ ත්‍රිපුද්ගල මහාධිකරණ විනිසුරු මඬුල්ල ඉදිරියේ පසුගිය 01 වනදා ආරම්භ කළ අවස්ථාවේ නීතිපතිවරයාගේ උපදෙස් පරිදි නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් ජනක බණ්ඩාර මහතා කරන ලද ඉල්ලීමක් සලකා බැලූ විනිසුරු මඬුල්ල එසේ ඊයේ (07දා) පස්වරු 2.30 ට නිට්ටඹුව නගරයට පැමිණ පස්වරු 3.30 දක්වා සිද්ධිය වූ ස්ථානය ඇතුළු අවට ප්‍රදේශය නිරීක්ෂණය කරනු ලැබූහ.

පළමුව විනිසුරු මඬුල්ල අමරකීර්ති මන්ත්‍රීවරයා පැමිණි ජීප් රථය නැවැත්වූ බව කියන නිට්ටඹුව ශක්ති වයින් ස්ටෝර්ස් ආයතනය අසල නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව කොළඹ මහනුවර ප්‍රධාන මාර්ගයේ කොළඹ දෙසට පා ගමනින් පැමිණ නඩුවට අදාළ සී සී ටී වී දර්ශන ලබාගෙන ඇති සිතාරා මීමන නීතිඥ කාර්යාලය හා බුලත් විට කඩයක් ද නිරීක්ෂණය කරනු ලැබීය.

ඉන් අනතුරුව ඝාතන සිදු වූ බව කියන නිහාල් පැෂන් ආයතනයේ මහල් තුනම නිරීක්ෂණය කරනු ලැබීය.

එවකට ගම්පහ අපරාධ ස්ථාන පරීක්ෂණාගාරයේ ස්ථානාධිපතිවරයා වශයෙන් සිටි වත්මන් වවුනියාව අපරාධ ස්ථාන පරීක්ෂණාගාරයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක කොල්ලුරේ මහතාගේ මගපෙන්වීම යටතේ එම නිරීක්ෂණයන් සිදු කරනු ලැබීය.

රජයේ නීතිඥ ක්‍රිෂාන් අල්විස් කුලතිලක මහතා ප්‍රමුඛ රජයේ නීතිඥ මහත්ම මහත්මීන් පිරිසක් සමග නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් ජනක බණ්ඩාර, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මනුෂ්‍ය ඝාතන හා සංවිධානාත්මක අපරාධ විමර්ශන අංශයේ සහකාර පොලිස් අධිකාරී චන්දන කළුආරච්චි, අත්තනගල්ල සහකාර පොලිස් අධිකාරී ප්‍රසාද් ප්‍රනාන්දු, නිට්ටඹුව පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක චන්දන කුමාර යන මහත්වරු ද විත්තියේ හා පැමිණිල්ලේ නීතීඥ මහත්ම මහත්මීන් පිරිසක් ද මෙම අවස්ථාවට සහභාගි වූහ.

# ගම්පහ සමෘද්ධි බැංකු සතු රු.බි. 17ක මුදලින් කොටසක් දිස්ත්‍රික්කයේ ගම් සංවර්ධනයට ආයෝජනය කරන්න

– අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන





● ගම්පහ තිලකරත්න දිසානායක

ගම්පහ දිස්ත්‍රික්කයේ සමෘද්ධි බැංකු සතුව පවතින රුපියල් බිලියන 17ක මුදලින් කොටසක් ආයෝජනය කොට දිස්ත්‍රික්කයෙහි ගම් සංවර්ධනය කරමින් ජනතාව නගාසිටුවීමට පියවර ගතයුතු බව අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතා ගම්පහදී පැවසීය.

'අලුත් ගමක් අලුත් රටක්' වැඩසටහන යටතේ ගම්පහ දිස්ත්‍රික්කයෙහි ප්‍රගතිය සමාලෝචනය කිරීම පිණිස අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පැවති විශේෂ රැස්වීමේදී අගමැතිවරයා මේ බව සඳහන් කළේය.

මෙහිදී අග්‍රාමාත්‍යවරයා තවදුරටත් අදහස් දක්වමින් සඳහන් කර සිටියේ, අස්වැසුම , වැඩිහිටි සහ ආබාධිත දීමනා මෙන්ම රෝගීන්ට සහන සැලසීමට රජය බැඳී සිටින බවත් මේ වෙනුවෙන් පවතින ගැටලු නිරාකරණය කිරීමට පියවර ගනිමින් ප්‍රාදේශීය ලේකම්වරුන් ඇතුළු රාජ්‍ය නිලධාරීන් තම දායකත්වය ලබා දෙමින් මිනිස්කමේ යුතුකම් ඉටුකළ යුතු බවත්ය.

දිස්ත්‍රික් ලේකම් සමන් දර්ශන පාඩිකෝරාල මහතා මෙහිදී දිස්ත්‍රික්කයෙහි ප්‍රගතිය ඉදිරිපත් කරමින් අනුකමිටු 12ක් ක්‍රියාත්මක කිරීම මත ගංවතුර පාලනය මෙන්ම ඩෙංගු මර්දනය පිණිස කටයුතු කිරීම සාර්ථක බවත් පැවසීය.

එමෙන්ම ඉදිරි වසරේදී දිස්ත්‍රික්කයේ වැව් 11ක් ප්‍රතිසංස්කරණය කිරීම සැලසුම් කොට ඇති බවත් අඩක් නිමකළ මාර්ග 87ක් සංවර්ධනය කිරීමටත්, කරස්නාගල ජල ව්‍යාපෘතිය කඩිනමින් අවසන් කළ යුතුව ඇති බවත් පැවසීය. සෞභාග්‍යා ගම්මාන වැඩසටහන යටතේ ගම් 42ක ප්‍රතිලාභීන් 2,268ක් වෙනුවෙන් ක්‍රියාත්මක බවත් දිස්ත්‍රික් ලේකම්වරයා කීය.

මෙම අවස්ථාවට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිවරුන්වන පාර්ලිමේන්තු මන්ත්‍රී සහන් ප්‍රදීප් විතාන, ආණ්ඩුකාර රොෂාන් ගුණතිලක, අමාත්‍ය ප්‍රසන්න රණතුංග, අමාත්‍ය නලින් ප්‍රනාන්දු, ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය අශෝක ප්‍රියන්ත යන මහත්වරුන් ඇතුළු රාජ්‍ය අමාත්‍යවරුන් සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, පළාත් සභාවේ සභාපති සුනිල් විජේරත්න, ලේකම් ප්‍රදීප් යසරත්න, ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් රංජිත් අශෝක, ගම්පහ දිසාපති සමන් දර්ශන පාඩිකෝරාල යන මහත්වරුන්ද ප්‍රාදේශීය ලේකම්වරුන් සහ දිස්ත්‍රික්කයේ රාජ්‍ය ආයතන ප්‍රධානීන් එක්ව සිටියහ.

# පුද්ගලයෙකුට හෙල්මට්වලින් පහර දී ඝාතනය කළ දෙදෙනෙක් අත්අඩංගුවට

● බණ්ඩාරගම බිමල් ශ්‍යාමන් ජයසිංහ

තියුණු ආයුධවලින් සහ ආරක්ෂක හිස් වැසුම්වලින් පහරදී පුද්ගලයකු ඝාතනය කළ තිදෙනෙකුගෙන් යුත් කණ්ඩායමේ දෙදෙනෙකු අත්අඩංගුවට ගත් බව බස්නාහිර පළාත දකුණු දිසාව අපරාධ කොට්ඨාසය සඳහන් කරයි.

කොස්ගම හා සූරියවැව පදිංචි 24-31 හැවිරිදි දෙදෙනෙක් මෙසේ අත්අඩංගුවට පත්ව සිටිති.

සැකකරුවන් සතුව තිබූ තියුණු ආයුධයක්ද පොලිස් භාරයට ගෙන ඇත.

හංවැල්ල, සිරිනිවාසවත්ත පහළ කොටස පදිංචිව සිටි කේ.විජය කුමාර් නමැත්තෙකු මෙම සිද්ධියෙන් ජීවිතක්ෂයට පත්ව තිබිණි.


මීට දින කීපයකට පෙරදී වෙළෙඳ සැලකට දුම්වැටියක් මිලදී ගැනීමට ගිය පුද්ගලයෙකුට පහරදීමකට පලිගැනීමක් ලෙස මෙම ඝාතනය සිදු කර තිබූ බව පොලීසිය සඳහන් කරයි.

ඝාතනයට පැමිණි සුද්දා නමැති සැකකරු පලා ගොස් ඇත.

බස්නාහිර පළාත් දකුණු දිසාව අපරාධ කොට්ඨාසය සිද්ධිය පිළිබඳ වැඩිදුර පරීක්ෂණ සිදු කරයි.

# ජයසූරියට පූර්ණ කාලීන ක්‍රිකට් පුහුණු උපදේශක තනතුර

## මහේලගේ තනතුරත් එලෙසින්ම



● ඕෂිත වරකපිටිය

ශ්‍රී ලංකා හිටපු සුපිරි ක්‍රිකට් ක්‍රීඩක සනත් ජයසූරිය මහතා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ පූර්ණ කාලීන පුහුණු උපදේශක තනතුරට පත් කිරීමට අනුමැතිය හිමි වූ බව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ඉහළ නිලධාරියෙකු තහවුරු කළේය.

මේ සඳහා වූ විධායක අනුමැතියද ඊයේ (07දා) දින හිමි වූ බවත්, සනත් ජයසූරියද ඒ සඳහා කැමැත්ත පළ කළ බවත් හෙතෙම අවධාරණය කළේය.

කෙසේ වෙතත් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ පුහුණු උපදේශක ලෙසින් ක්‍රියා කළ මහේල ජයවර්ධනගේ කොන්ත්‍රාත් කාලයද අවසන් නොමැති බැවින් ඔහුද, තවදුරටත් ක්‍රිකට් ආයතනයේ උපදේශකයෙකු ලෙසින් ක්‍රියා කරන බවද අදාළ නිලධාරියා පැවසීය.

එමෙන්ම ජයසූරියගේ නව තනතුර පූර්ණ කාලීන තනතුරක් බවත්, මහේල ජයවර්ධනගේ තනතුර පූර්ණ කාලීන නොවන නිසා එම තනතුරු දෙකෙහි වෙනසක් ඇති බව සඳහන් කළේය.

ඒ අනුව සනත් ජයසූරිය මේ මස 15වැනිදා සිට සිය නව තනතුරෙහි වැඩ භාර ගන්නා බවත්, ඔහුගේ ධුර කාල සීමාව පිළිබඳ තවමත් සාකච්ඡා කර නොමැති බවද අදාළ නිලධාරියා වැඩිදුරටත් දන්වා සිටියේය.

1989 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා පුරා වසර 22ක් ශ්‍රී ලංකාව නියෝජනය කළ සනත් ජයසූරිය, අන්තර්ජාතික පිටියේ ක්‍රීඩකයෙකු ලෙස වැඩිම අත්දැකීම් ඇති පුද්ගලයෙකි. ලොව වැඩිම එක්දින තරග ප්‍රමාණයක් ක්‍රීඩා කළ ක්‍රීඩකයන් අතර තෙවැනි ස්ථානයේ පසුවන ඔහු, වැඩිම එක්දින ලකුණුලාභීන් අතරද ලොව පස්වැනි ස්ථානයේ පසුවෙයි.

ජයසූරිය මීට පෙර 2013-2015 වර්ෂ අතරවාරයේ ශ්‍රී ලංකා ක්‍රිකට් තේරීම් කමිටු ප්‍රධානී ලෙසින්ද ක්‍රියා කළ අතර, එම කාලසීමාවේදී එනම් 2014 වසරේදී ශ්‍රී ලංකාව විස්සයි20 ලෝක ශූරයන් ලෙසින්ද කිරුළු පැළඳියේය. එමෙන්ම ආසියානු කුසලානය මෙන්ම එංගලන්තයේදී ටෙස්ට් තරගාවලි ජයග්‍රහණයක් හිමිකර ගැනීමටද ශ්‍රී ලංකාව සමත් විය. ඉන් අනතුරුව 2016 වර්ෂයේ සිට 2017 වර්ෂයේ අග දක්වාද සනත් තේරීම් කමිටු ප්‍රධානී ලෙසින් ක්‍රියා කළේය.

මේ අතර ශ්‍රී ලංකා කණ්ඩායමේ පුහුණු උපදේශකයෙකු ලෙසින් ක්‍රියා කරන මහේල ජයවර්ධනගේ ධුර කාලය අවසන්වීමක් සම්බන්ධයෙන්ද මේ වන තෙක් කතාබහක් ඇති වී නොමැත. 2021 වර්ෂයේ අගදී මෙම තනතුරට පත් මහේලගේ ධුර කාලය මේ වසර මුලදී තවත් වසරකින් දීර්ඝ කළේය.

කෙසේ වෙතත් මහේලගේ පුහුණු උපදේශක ධුරය සම්බන්ධයෙන් දැඩි ගැටලුවක් මතු වූයේ, පසුගිය කාලයේදී ශ්‍රී ලංකා කණ්ඩායම ජාත්‍යන්තර පිටියේදී දැක්වූ දුර්වල දක්ෂතා හේතුවෙනි. එමෙන්ම මහේල, ශ්‍රී ලංකා කණ්ඩායම සහභාගි වන ඇතැම් තරගාවලි සඳහා සහභාගි නොවීමද ඔහුගේ තනතුර පිළිබඳ ගැටලුකාරී තත්ත්වයක් මතු කළේය.

---

අන්තර්සමාජ තෙදින ක්‍රිකට් තරගාවලිය

# එස්.එස්.සී. - පොලිස් අවසන් සටන අද සිට

● සංජීව ධර්මසේන

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් සංවිධානය කරනු ලබන අන්තර්සමාජ මේජර් ලීග් තුන්දින ක්‍රිකට් තරගාවලියේ අවසන් මහා තරගය කොළඹ එස්.එස්.සී. හා පොලිස් ක්‍රීඩා සමාජ අතර කොළඹ එන්.සී.සී. ක්‍රීඩාංගණයේදී අද (08දා) ආරම්භ වේ. මෙය තෙදින තරගාවලියක් වුවද, අවසන් සටන පමණක් සිවු දිනක් පුරා පැවැත්වීමට කටයුතු යොදා ඇත.

'ඒ' හා 'බී' ලෙස කොටස් දෙකක් යටතේ එක් කාණ්ඩයකට කණ්ඩායම් 11 බැගින් වූ කණ්ඩායම් 22ක සහභාගිත්වයෙන් මෙම තරගාවලියේ මූලික වටයේ තරග පැවැත්විණි.

එහිදී දැක්වූ දක්ෂතා අනුව ක්‍රීඩා කළ සමස්ත තරග 10න් තරග 03ක් ජයගෙන, එකදු තරගයක් හෝ පරාජය නොවී තරග 06ක් ජය පරාජයෙන් තොරව අවසන් කරගත් එස්.එස්.සී. කණ්ඩායම 'ඒ' කාණ්ඩයේ පෙරමුණ ගත්හ. ඒ හැරෙන්න එක් තරගයක් විසඳුමක් නැතිව අවසන් වී ඇත.

පොලිස් කණ්ඩායමද අවසන් සටනට පැමිණියේ 'බී' කාණ්ඩයේ ප්‍රසාද ලකුණු සටහනේ පෙරමුණ හිමිකරගෙන වූ අතර, ඔවුන්ද ක්‍රීඩා කළ තරග 10න් තරග 03ක් ජය ගැනීමට සමත් විය. ඒ හැරෙන්න තරග 06ක් ජය පරාජයෙන් තොරව අවසන් කරගෙන ඇති අතර, එක් තරගයක් විසඳුමකින් තොරව අවසන් වී ඇත.

පොලිස් කණ්ඩායමේ නායක ලෙස අශේන් බණ්ඩාරද, එස්.එස්.සී. කණ්ඩායමේ නායක ලෙස නිපුන් ධනංජය ද කටයුතු කරනු ලබයි.

---

බටහිර ආසියානු කනිෂ්ඨ අධිවේගී (බ්ලිට්ස්) චෙස් තරගාවලිය

# රනිදු ලියනගේගෙන් ශ්‍රී ලංකාවට ලෝකඩ පදක්කමක්

● කරන්දෙණිය - එම්. සුසිල් ප්‍රියන්ත

බටහිර ආසියානු කනිෂ්ඨ අධිවේගී (බ්ලිට්ස්) චෙස් තරගාවලියේදී ශ්‍රී ලංකාවට ලෝකඩ පදක්කමක් දිනාදීමට කොළඹ ආනන්ද විද්‍යාලයේ රනිදු ලියනගේ සමත් විය. කෙසේ නමුත් ඔහු හැරෙන්න මෙම කාණ්ඩයෙන් වෙනත් කිසිවෙකුට පදක්කමක් දිනාගැනීමට නොහැකි විය.

කොළඹ ලෝක වෙළෙඳ මධ්‍යස්ථාන ශ්‍රවණාගාරයේදී පසුගියදා අවසන් වූ මෙම තරගාවලියට ශ්‍රී ලංකාව ඇතුළුව රටවල් 07ක වයස අවුරුදු 20ට අඩු ක්‍රීඩක ක්‍රීඩිකාවෝ 84දෙනෙකු සහභාගි වූහ. ඉන් බාලක අංශයෙන් 40ක්ද, බාලිකා අංශයෙන් 44ක්ද තරග කළහ.

මෙහි බාලක අංශයේ ශූරතාව ඉන්දියාව දිනාගනිද්දී, එහි අනුශූරතාව බංග්ලාදේශය දිනාගත්තේය.

මෙම බටහිර ආසියානු කනිෂ්ඨ චෙස් තරගාවලියේ මීට පෙර පැවති වේගී හා ක්ලැසිකල් තරගාවලි දෙකේදීම ලංකාව


රනිදු ලියනගේ

රිදියෙන් බැබළ වූ කොළඹ විචර්ලි ජාත්‍යන්තර පාසලේ ඔෂිනි ගුණවර්ධනට මෙම කාණ්ඩයෙන් හිමි වූයේ සිවුවැනි ස්ථානයයි.

මෙම අංශයේ ශූරතාව කසකස්තානය දිනාගත් අතර, අනුශූරතාව ටර්ක්මෙනිස්තානය දිනාගත්තේය. තෙවැනි ස්ථානය ඉන්දියාව සතු විය.

---

වයස අවුරුදු 13න් පහළ අන්තර්පාසල් ක්‍රිකට් තරගාවලිය

# ගෙසඳුගේ කඩුලු ත්‍රිත්වයෙන් මහින්දයට පළමු ඉනිමේ ජයක්

ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමයේ අධීක්ෂණය යටතේ පැවති වයස අවුරුදු 13න් පහළ අන්තර්පාසල් ක්‍රිකට් තරගාවලියේ ගාල්ල ශා. ඇලෝසියස් විද්‍යාලයට එරෙහිව පැවති තරගයේදී තුන් ඉරියව්වෙන්ම දක්ෂතා දක්වා තම විද්‍යාලයට පළමු ඉනිමේ ජයක් රැගෙන ඒමට මහින්ද විදුහලේ ගෙසඳු බියස් සමත් විය.

මෙම තරගයේ පන්දු යැවීමෙන් ගෙසඳු කඩුලු 05ක් දවාලූ අතර, පහරදීමෙන්ද ඔහු නොදැවී ලකුණු 39ක් රැස්කිරීමට සමත් විය.

පළමුව පන්දුවට පහරදුන් මහින්ද කණ්ඩායම සිය පළමු ඉනිමට කඩුලු 09ක් දැවී ලකුණු 103ක් රැස් කළේය. එහිදී සනුග තෙත්මිර (ලකුණු 47) පන්දුවට පහරදීමෙන්ද, යෙනුල් නෙත්සුක (2/31) පන්දු යැවීමෙන්ද දක්ෂතා දැක්වීය.

කෙසේ නමුත් පිළිතුරු ඉනිම ක්‍රීඩා කළ ශා. ඇලෝසියස් කණ්ඩායමට රැස්කළ හැකි වූයේ, ලකුණු 51ක් පමණි. යෙනුක පිලිප් (නොදැවී 21) පිත්තෙන් දක්ෂතා දක්වද්දී, කඩුලු ත්‍රිත්වයක් සමගින් ගෙසඳු ලකුණු 08කට කඩුලු 05ක් දවාගත්තේය.



ඒ අනුව නැවතත් දෙවැනි ඉනිම ඇරඹූ මහින්ද කණ්ඩායම ලකුණු 50ක් රැස්කර ඉනිම අත්හිටුවීය. එහිදී ප්‍රහාරාත්මක පිතිහරඹයක නිතර වූ ගෙසඳු පන්දු 19කින් නොදැවී ලකුණු 39ක් රැස්කිරීමට සමත් වූ අතර, එම ඉනිමට හයේ 03ක් හා හතරේ 02ක් ඇතුළත් විය.

දිනය නිමා වනවිට සිය දෙවැනි ඉනිම ක්‍රීඩා කරමින් සිට ශා. ඇලෝසියස් කණ්ඩායම එක් කඩුල්ලක් දැවී ලකුණු 18ක් රැස්කරගෙන සිටියේය.

---

වයස 19න් පහළ අන්තර්පාසල් ක්‍රිකට් තරගාවලිය (දෙවැනි කාණ්ඩය ටියර් බී)

# මාරිස්ටෙලා කිංග්ස්වුඩ් අ.අ.පූ. තරගය අද


කිංග්ස්වුඩ් නායක නෙනුක (වමේ) හා මාරිස්ටෙලා නායක යොහාන්

ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමයේ අධීක්ෂණය යටතේ පැවැත්වෙන වයස අවුරුදු 19න් පහළ අන්තර්පාසල් ක්‍රිකට් තරගාවලියේ දෙවැනි කොටස ටියර් බී (Division 2 Tier B) කාණ්ඩයේ අර්ධ අවසන් පූර්ව වටයේ තරගයක් මහනුවර කිංග්ස්වුඩ් විදුහල හා තිඹිරිගස්කටුව මාරිස්ටෙලා විදුහල අතර සූරියවැව ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණයේදී අද (08දා) පැවැත්වේ.

කිංග්ස්වුඩ් විදුහල තමන් ක්‍රීඩා කළ කාණ්ඩයේ අනුශූරයන් බවට පත් වෙමින් මෙම තරගයට සුදුසුකම් ලබාගත් අතර, මාරිස්ටෙලා විදුහල මෙම අවස්ථාව උදාකර ගත්තේ ඔවුන් ක්‍රීඩා කළ කාණ්ඩයේ තෙවැනි ස්ථානයට පත් වෙමිනි.

නෙනුක දිසානායක කිංග්ස්වුඩ් කණ්ඩායමට නායකත්වය ලබාදෙන අතර, යොහාන් ප්‍රනාන්දු විසින් මාරිස්ටෙලා කණ්ඩායම මෙහෙයවනු ලබයි.

---

# ලෝක යොවුන් ස්ක්‍රැබල් ශූර ගාල්ල මහින්දයේ දිල්මිත්ට උපහාර



● කරන්දෙණිය - එම්. සුසිල් ප්‍රියන්ත

තායිලන්තයේදී පැවැති වයස අවුරුදු 18න් පහළ ලෝක යොවුන් ස්ක්‍රැබල් තරගාවලියේ ශූරතාව දිනාගත් ගාල්ල මහින්ද විද්‍යාලයේ හිවින් දිල්මිත් හට ඔහු අධ්‍යාපනය ලබන ගාල්ල මහින්ද විද්‍යාලය විසින් ඊයේ (07දා) උපහාර දක්වනු ලැබීය. විදුහල්පති රුසිර මද්දුමහේවගේ මහතා ඇතුළු ගුරුදෙගුරුන්ගේ ප්‍රධානත්වයෙන් මෙම උත්සවය පැවැත්විණ.

තායිලන්තයේ ට්‍රැඩ් නුවරදී ලොව රටවල් 17ක ක්‍රීඩක ක්‍රීඩිකාවන් 142දෙනෙකුගේ සහභාගිත්වයෙන් ඉකුත්දා (දෙසැ. 01 - 03 දක්වා) පැවැති මෙම තරගාවලියේදී 16 හැවිරිදි හිවින් දිල්මිත් ශූරතාව දිනාගැනීමට සමත් විය.

ඒ අනුව විදුහලටත්, රටටත් කීර්තියක් අත්කර දුන් දිල්මිත්ව විදුහල් ප්‍රධාන පිවිසුමේදී මහින්ද විදුහල්පති රුසිර මද්දුමහේවගේ මහතා ඇතුළු මහින්ද විදුහල් ප්‍රජාව මහත් හරසරින් පිළිගත්හ.

විදුහල් තූර්යවාදක කණ්ඩායම පෙරටු කොටගෙන පෙරහරින් විදුහල් ප්‍රධාන ශාලාව දක්වා ඔහු කැඳවාගෙන ගොස් උපහාර පිදීමක්ද සිදු කෙරිණ.

---

# යාපනය විවෘත චෙස් තරගාවලිය අද සිට

## යාපනයේදී පවත්වනු ලබන පළමු ජාත්‍යන්තර චෙස් තරගාවලිය මෙයයි



● කරන්දෙණිය - එම්.සුසිල් ප්‍රියන්ත

යාපනය දිස්ත්‍රික් චෙස් සංගමය විසින් පළමු වරට සංවිධානය කරනු ලබන යාපනය විවෘත (Jaffna Open) ජාත්‍යන්තර චෙස් තරගාවලිය අද (08දා) සිට 12වැනිදා දක්වා යාපනය කොකුවිල් චෙල්වා ප්ලේස් උත්සව ශාලාවේදී පැවැත්වේ. මෙය යාපනය දිස්ත්‍රික්කය කේන්ද්‍ර කරගනිමින් පවත්වනු ලබන පළමු ජාත්‍යන්තර චෙස් තරගාවලියද වේ.

දෙස් විදෙස් ක්‍රීඩක ක්‍රීඩිකාවන් 500කට වැඩි පිරිසක් සහභාගිවන මෙම තරගාවලිය තරග වට දහයකින් සමන්විතය. ඉන් තරගාවලිය ආරම්භක දිනය වන අද සිට අවසන් දින දක්වා දින පහේදී දිනකට තරග වට දෙක බැගින් පැවැත්වීමට කටයුතු යොදා ඇත.

ඒ අනුව තරග වට දහයෙන් ලබා ගන්නා ලකුණු පිළිවෙළ මත තරගාවලියේ පිරිමි කාන්තා ශූරතා මෙන්ම, වයස් කාණ්ඩයන්හි ජයග්‍රාහකයන් තෝරා ගනු ලබයි. මෙවර ජයග්‍රහණ වෙනුවෙන් රුපියල් ලක්ෂ විසිහතරක මුදලක් බෙදාදීමට සංවිධායක මණ්ඩලය කටයුතු යොදා ඇත.

ඉන් පිරිමි ශූරතාව සඳහා රු. 200,000ක්, එහි අනුශූරතාවට රු. 150,000ක් හා තෙවැනි ස්ථානයට රු. 100,000ක් පිරිනමනු ලබන අතර, කාන්තා ශූරතාව සඳහා රුපියල් 100,000ක්, එහි අනුශූරතාවට රු. 50,000ක් හා තෙවැනි ස්ථානයට රු. 25,000ක් පිරිනමනු ලබයි. ඊට අමතරව වයස් කාණ්ඩවල ජයග්‍රාහක ජයග්‍රාහිකාවන් සඳහාද මුදල් ත්‍යාග ලබාදීමට සංවිධායකයන් කටයුතු යොදා ඇත.

---

# සී.ආර්. කණ්ඩායමට ෆස්ට් කැපිටල් නිල අනුග්‍රාහකත්වය




● ඕෂිත වරකපිටිය

මෙවර රග්බි තරග වාරයට තරග වදින සී.ආර්. ඇන්ඩ් එෆ්.සී. කණ්ඩායමේ නිල අනුග්‍රාහකත්වය ෆස්ට් කැපිටල් හෝල්ඩිංග්ස් ආයතනයට හිමි වී ඇත. ජනශක්ති සමූහයේ සමාගමක් වන ෆස්ට් කැපිටල්, රග්බි ක්ෂේත්‍රයට පිවිසෙන පළමු අවස්ථාව මෙය වෙයි. ඔවුන් එහිදී වැඩිදුරටත් නිවේදනය කරනුයේ, මේ හරහා ශ්‍රී ලංකාවේ රග්බි ක්‍රීඩාවේ වර්ධනය උදෙසා කටයුතු කිරීම ඉලක්කගත කෙරෙන බවයි.

මේ සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ මාධ්‍ය හමුවක් පසුගියදා කොළඹදී පැවැත්විණි. මේ සඳහා ෆස්ට් කැපිටල් ආයතනයේ අලෙවිකරණ ප්‍රධානී රන්දිනිත් මදනායක, සී.ආර්. ඇන්ඩ් එෆ්.සී. නියෝජනය කරමින් එහි සභාපති ටිකිරි ඇල්ලේපොළ යන මහත්වරුද එක්ව සිටියහ.

ශ්‍රී ලංකාවේ පැරණිතම හා ජනප්‍රියම ක්‍රීඩා සමාජයක් වන සී.ආර්. ඇන්ඩ් එෆ්.සී. ක්‍රීඩා සමාජය පසුගිය (2023) ක්ලිෆර්ඩ් කුසලාන පිළිමළුන් පිටුදැකීමේ තරගාවලියේ ශූරතාව මෙන්ම අන්තර්සමාජ ලීග් රග්බි තරගාවලියේ අනුශූරතාවද හිමිකර ගැනීමට සමත් වූ කණ්ඩායමයි.

මෙහිදී ෆස්ට් කැපිටල් ආයතනය වැඩිදුරටත් පවසන්නේ, සී.ආර්. ආයතනයේ අවධානය යොමු වී ඇති රග්බි ඇකඩමියක් ආරම්භ කිරීමට හවුල් වීමට ලැබීම සම්බන්ධයෙන් තමන්ට නිහතමානී ආඩම්බරයක් ඇති බවයි.




කොළඹ 2 හුණුපිටිය හරස් පාරේ අංක 08 දරන ස්ථානයේ පිහිටි විජය නිවුස්පේපර්ස් ලිමිටඩ් විසින් 2023 දෙසැම්බර් මස 08වැනි සිකුරාදා එම ස්ථානයේදී මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.